# ප්‍රතිඵල කළමනාකරණ ක්‍රියාවලිය

1 
උත්තේජක මර්දන නීති උල්ලංඝනය කිරීම

2 ක්‍රීඩකයාට දැනුම් දීම


3 
මූලික පරීක්ෂණය

4 B - සාම්පල විශ්ලේෂණය
(ක්‍රීඩකයාගේ ඉල්ලීම මත)


5 
විනය පරීක්ෂණය
(දඬුවම් පැනවීම)

අභියාචනා පරීක්ෂණය
(ක්‍රීඩකයාගේ ඉල්ලීම මත)

6 ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය (CAS)
(ක්‍රීඩකයාගේ ඉල්ලීම මත)


මෙම තොරතුරු ඕනෑම අවස්ථාවක යාවත්කාලීන විය හැකි බැවින් වඩාත් නිවැරදි නවතම තොරතුරු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙන් (SLADA), ජාත්‍යන්තර සංගමයෙන් (IF) හෝ ජාතික සංගමයෙන් (NF) ලබා ගැනීමට කටයුතු කරන්න.


## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

363/12, සුගතදාස ස්ටේඩියම්-බිලොක් ඩී,
ක්‍රීඩා සංකීර්ණ රඨගාල පාර,
සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.

විද්‍යුත් තැපෑල: sladasl@yahoo.com
දූරකථන අංකය : 0112 328 366, 0112 328 367, 0113 071 838
ෆැක්ස් : 0112 328 370
විශේෂ පැමිණිලි ඒකකය : 070 422 0422

AntiDoping SriLanka/ SLADA Education   slada_official   Sri Lanka Anti-Doping Agency


**Find out more at wada-ama.org**

# ප්‍රතිඵල කළමනාකරණය

(Results Management)




UNESCO Anti-Doping Convention

With the Support of the Fund for the Elimination of Doping in Sport

SLADA

WORLD ANTI-DOPING AGENCY
play true

# ISRM
## යනු,

ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතිය (ISRM) යනු ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයේ කොටසක් ලෙස වැඩිදියුණු කරන ලද ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන අනිවාර්ය ජාත්‍යන්තර ප්‍රමිතියකි.




# දඬුවම් පැනවීම

ක්‍රීඩකයෙකු උත්තේජක මර්දන නීති රෙගුලාසි කඩ කළ විට, **ජීවිතාන්තය දක්වා තරග තහනමක්** පැනවිය හැක. තරග තහනම සඳහා පහත සඳහන් කරුණු පදනම් වේ.

- උල්ලංඝනය කරන ලද උත්තේජක මර්දන නීති
- එම සිදුවීමට අදාළ කරුණු
- භාවිතා කරන ලද තහනම් ද්‍රව්‍යය හා එහි මාත්‍රාව
- පෙර සිදු කළ උත්තේජක මර්දන නීති උල්ලංඝනය කිරීම්

තහනම් උත්තේජක ලබාගත් බවට සනාථ වූ පසු ව, ලබා දෙන දඬුවමක් සම්බන්ධයෙන් නැවත සලකා බැලීමට ඉල්ලුම් කිරීමට ඔබට හිමිකම ඇත.

# ADRVs
## යනු,

තහනම් උත්තේජක හා සම්බන්ධ නීති උල්ලංඝනය කිරීම යි.



01 ක්‍රීඩකයෙකුගේ මුත්‍රා/රුධිර සාම්පලයක තහනම් උත්තේජක ද්‍රව්‍ය පැවතීම.

02 තහනම් ද්‍රව්‍යයක් භාවිතා කිරීම හෝ භාවිතා කිරීමට උත්සහ කිරීම.

03 තහනම් උත්තේජක පරීක්ෂණය සඳහා තෝරා ගත් විට එම පරීක්ෂණය සඳහා මුත්‍රා/ රුධිර සාම්පල ලබා නොදී මගහැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

04 ක්‍රීඩකයෙකු ඔහු සිටින ස්ථාන පිළිබඳ තොරතුරු නිවැරදි ව යාවත්කාලීන නොකිරීම, අසම්පූර්ණ හෝ වැරදි තොරතුරු ඉදිරිපත් කිරීම සහ උත්තේජක පරීක්ෂණ නිලධාරීන් පරීක්ෂණ සඳහා යන විට ක්‍රීඩකයා එම ස්ථානවල නොසිටීම.

05 තහනම් උත්තේජක පරීක්ෂණ ක්‍රියාවලියට අදළ ඕනෑම අවස්ථාවක් විකෘති කිරීම.

06 විශේෂ අවසරයකින් තොර ව තහනම් ද්‍රව්‍යයක් සන්තකයේ තබා ගැනීම හෝ තහනම් කරන ලද ක්‍රමයක් භාවිත කිරීම.

07 තහනම් ද්‍රව්‍ය හැසිරවීම, ලබා දීම, ප්‍රසම්පාදනය, ප්‍රවාහනය කිරීම, විකිණීම හෝ විකිණීමට උත්සහ කිරීම.

08 තහනම් ද්‍රව්‍යයක් ක්‍රීඩකයෙකුට ලබා දීම හෝ ලබා දීමට උත්සහ කිරීම, තහනම් ක්‍රමයක ක්‍රීඩකයෙකු යෙදවීම හෝ යෙදවීමට උත්සහ කිරීම.

09 උත්තේජක මර්දන නීති උල්ලංඝනය කිරීම සඳහා සහයදීම, උනන්දු කිරීම හෝ ඒ පිළිබඳ තොරතුරු වසන් කිරීමට උපකාර කිරීම.

10 තහනමට ලක් ව ඇති ක්‍රීඩකයෙකුගෙන් හෝ සහය පුද්ගලයෙකුගෙන් තහනම් කාල සීමව තුළ සේවය හෝ උපකාර ලබා ගැනීම.

11 උත්තේජක මර්දන නීති උල්ලංඝනය පිළිබඳ වාර්තා කළ අයෙකු බිය ගැන්වීම හෝ පළිගැනීම.